# සාරාංශය

නව යෞවනවියේ සිසුන් පාදක කොට ගෙන පාසල්වල පැන නගින විනය ගැටලු පිළිබඳව සිදු කරන ලද මෙම පර්යේෂණ නිබන්ධය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනපති උපාධිය සඳහා සිදු කරන ලද්දකි. මේ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ තෝරා ගත් පාසල් දෙකක් ඇසුරු කර ගෙන සිසුන් 100 දෙනෙක්, ගුරුභවතුන් 10 දෙනෙක් හා විදුහල්පතිවරු 2ක් නියැදිය ලෙස තෝරාගෙන මෙය සිදු කරන ලදි.

මෙම අධ්‍යයනය අරමුණු හතරක් යටතේ සිදු කරන ලදි. ඒවා නම් නව යෞවනයන් සම්බන්ධ කොට ගෙන පාසල්වල ඇතිවන විනය ගැටලු හඳුනා ගැනීම, එම විනය ගැටලු සඳහා පාසල් පරිසරය ආශ්‍රිත සාධක හා පුද්ගල බද්ධ සාධක බලපාන්නේ ද? යන්න විමසා බැලීම, යෞවනයන් සම්බන්ධ විනය ගැටලු අවම කර ගැනීම සඳහා පාසල් තුළින් ගෙන තිබෙන පියවර පිළිබඳව සොයා බැලීම හා අනාවරණය කර ගත් සාධක මත නව යෞවනයන් සම්බන්ධ විනය ගැටලු අවම කිරීමට ගත යුතු ඍජු හා වක්‍ර ක්‍රියා මාර්ග මොනවාද යන්න පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීම යනුවෙනි.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මඟින් මේ සඳහා දත්ත ලබා ගෙන ඇති අතර නවයෞවනයන්ට හා ගුරුවරුන්ට ප්‍රශ්නාවලි ඉදිරිපත් කරන ලදි. එසේ ම විදුහල්පතිවරු හා ගුරුවරුන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. මෙමගින් ලබා ගත් දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගනු ලැබුවේ විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යි.

පාසල්වල විනය ගැටලු විවිධ ස්වරූප ගන්නා බව අනාවරණය වූ අතර ඒවා පන්ති කාමරයේ ඇතිවන විනය ගැටලු හා පන්ති කාමරයෙන් පිටත දී ඇතිවන විනය ගැටලු ලෙස වෙන් කොට හඳුනාගත හැකි විය. ඒවා අතර ඩෙස් පුටු විනාශ කිරීම (කැඩීම / කුරුටු ගෑම) පරුෂ වචන භාවිතය. කාල පරිච්ඡේදය තුළ පන්තියේ රැඳී නොසිටීම, කොණ්ඩය සම්බන්ධ විලාසිතා ආදිය ප්‍රධාන වේ.

එසේ ම විනය ගැටලුවල ස්වභාවය අනුව වර්ග 7කට බෙදා දක්වා තිබේ. ඒවා වචනය හා සම්බන්ධ විනය ගැටලු, පන්ති කාමරයට හා ඉගෙනුමට අදාළ විනය ගැටලු, පන්ති කාමරයෙන් පිටත විනය ගැටලු, විලාසිතා සම්බන්ධ විනය ගැටලු, ඇඳුම් පැළඳුම් සම්බන්ධව පැන නැඟී ඇති විනය ගැටලු, නීති විරෝධී විනය ගැටලු හා සදාචාර විරෝධී විනය ගැටලු ලෙස දක් විය හැකි ය. එම විනය ගැටලු සඳහා අවවාද කිරීම, වැරදි නොසලකා හැරීම, විදුහල්පති ළඟට යාම, අව්වේ සිටුවා තැබීම, කුණු බාල්දිය ඉවත් කිරීමට කීම, අතුගෑම, බුදුන් වැන්ද වීම හා පන්තියේ සිටුවා තැබීම වැනි

ලිහිල් දඬුවම් ක්‍රම මෙන් ම කාර්යාලය ඉදිරිපිට බොහෝ වේලාවක් සිටුවා තැබීම, දෙමාපියන් පාසලට ගෙන්වීම, වේවැලෙන් ගැසීම, අතින් ගැසීම, සැරෙන් අවවාද කිරීම, පන්තියෙන් එළියට දැමීම, පන්ති තහනම, පාසලෙන් ඉවත් කිරීම හා දණ ගැස්වීම වැනි දැඩි දඬුවම් ක්‍රම ද භාවිත කරන බව පෙනේ.

පාසලේ නව යෞවනයන් සම්බන්ධයෙන් වන විනය ගැටලු අවම කිරීමට පාසල් පරිපාලනය විසින් විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇත. ඒවා නම් විනය මණ්ඩල පිහිටුවීම, විදුහල්පතිතුමා දැඩිව විනය පිළිබඳව සොයා බැලීම, ශිෂ්‍ය නායක නායිකාවන් මගින් විනය ගැටලු පිළිබඳව සොයා බැලීම, සිසුන්ගේ මානසික සංහිඳියාව සඳහා භාවනා හා ධර්ම දේශනා, වැඩමුළු පැවැත්වීම හා දෛනිකව උදේ දහවල් භාවනා වැඩ සටහන් ශබ්ද විකාශන මගින් සුළු වේලාවක් පැවැත්වීම වැනි දේ ය.

සිසුන්ගේ විනය ගැටලු අවම කිරීමට ගත යුතු පියවර සම්බන්ධයෙන් ද තොරතුරු අනාවරණය විය. ප්‍රභේද 6ක් යටතේ එම යෝජනා ගොනු කොට ඉදිරිපත් කොට ඇත. පාසල් කළමනාකරණය ආශ්‍රිත යෝජනා, ගුරුවරුන් ආශ්‍රිත යෝජනා, දෙමාපියන් ආශ්‍රිත යෝජනා, ශිෂ්‍ය නායකයින් සම්බන්ධ යෝජනා, අධ්‍යාපන බලධාරීන් හා සම්බන්ධ යෝජනා හා පාසල් පරිසරය ආශ්‍රිත යෝජනා ය.